ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (පෞද්ගලික) සමාගම - 2018
------------------------------------------------------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (පෞද්ගලික) සමාගමේ ("සමාගම") 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

--------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව **2018** දෙසැම්බර් **31** දිනට දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය රු. **13,414,282** ක් විය. කෙසේ වුවද, සමාගම ස්ථාවර වත්කම් ලේඛනය හා විස්තරාත්මක උපලේඛන නිසි පරිදි පවත්වාගෙන ගොස් නොතිබුණි. එනිසා එම ශේෂයන්හි නිරවද්‍යතාවය, පැවැත්ම හා අගය කිරීම විගණනයට තහවුරු කරගැනීමට නොහැකි විය. | නිරීක්ෂණය නිවැරදිය. කෙසේ වුවද, සමාගම විසින් මිළදී ගත් වර්ෂය හා දිනය, අයිතම විස්තරය, වටිනාකම, හා සැපයුම්කරු ආදී සියළු තොරතුරු ඇතුළත් ස්ථාවර වත්කම් ලේඛනයක් දැනට පවත්වාගෙන යනු ලබයි. | සමාගම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යා යුතු අතර ස්ථාවර වත්කම්වල නිරවද්‍යතාවය තහවුරු කළ යුතුය. |
| (ආ) | කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්හි **17.19** වගන්තිය අනුව වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය කලයුතු අතර ප්‍රවර්ථන අපේක්ෂාව පෙර ඇස්තමේන්තු වලින් වෙනස් | සමාගම වත්කම්වල අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කර **2021** මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කරනු ඇත. | සමාගම කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්හි විධිවිධානවලට අනුකූල විය යුතු වේ. |

වන්නේ නම් එම වෙනස කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 10.15 සිට 10.18 දක්වා වන වගන්ති අනුව ගිණුම්ගත කළ යුතු වේ. කෙසේ වුවද, තවමත් භාවිතයේ පවතින රු.12,218,381 ක වටිනාකමැති සම්පූර්ණයෙන්ම ක්ෂය වූ දේපල පිරියත හා උපකරණ එපරිදි සමාලෝචනය කර ගිණුම්ගත කර නොතිබුණි.

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරන යහපාලන මාර්ගෝපදේශ සඳහා වූ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| 9.2 මාර්ගෝපදේශය | අනුමත කාර්ය මණ්ඩලයක් සහිත ලියාපදිංචි සංවිධාන ව්‍යුහයක් සමාගම සතුව නොපවතියි. | ඔබගේ නිරීක්ෂණයට එකඟ වන අතරම, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තිය සහ 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරන යහපාලන මාර්ගෝපදේශ සඳහා වූ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 හා 9.3.1 මාර්ගෝපදේශ | සමාගම යහපාලන මාර්ගෝපදේශයන්හි අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කල යුතු වේ. |
| 9.3.1 මාර්ගෝපදේශය | සෑම තනතුරක් සඳහාම බඳවාගැනීමේ හා උසස් කිරීමේ ක්‍රමවේදයක් සමාගම සතුව නොමැත. | සම්බන්ධයෙන් අදහස් දැක්වීමේදී, සමාගම සයිබර් ආරක්ෂණය සම්බන්ධව ආයතනික රාමුව ක්‍රමවත් කිරීම සඳහා සයිබර් ආරක්ෂණ පනත ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කිරීමට පිළියෙල කරමින් පවතින බව පෙන්වාදෙයි. සයිබර් ආරක්ෂණ පනත මගින් මාර්ගෝපදේශ 9.2 හා 9.3.1 සම්බන්ධ ගැටළු සඳහා විසඳුම් ලබා දෙනු ඇත. මෙම | සමාගම යහපාලන මාර්ගෝපදේශයන්හි අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කල යුතු වේ. |

| | | |
|---|---|---|
| | වර්ෂයේ අග භාගයේදී මෙම පනත සඳහා අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂිතයි. | |

**2.** මූල්‍ය සමාලෝචනය

**2.1** මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 12,514,270 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 9,254,445 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 3,259,825 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ප්‍රදාන ලැබීම් සහ වෙනත් ආදායම්හි වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියාගේ දීමනා වශයෙන් අනුමැතියකින් තොරව රු.8,520,000 ක වියදමක් සමාගම සිදුකර තිබුණි. | අදාළ ලියකියවිලි අමුණා ඇත. | සියළු ගෙවීම් විධිමත් අනුමැතීන් සහිතව සිදු කළ යුතු වේ. |
| (ආ) | සමාගම පාරිතෝෂික වියදම් සඳහා රු.12,424,250 ක වෙන් කිරීමක් සිදුකර තිබුණි. කෙසේ වුවද, පාරිතෝෂික වගකීම් පැනනැගීමේදී ඒවා සපුරාලීම සඳහා වෙන් වශයෙන් අරමුදල් ආයෝජනය කිරීමට සමාගම අපොහොසත්ව තිබුණි. | 2020 සැප්තැම්බර් 28 දින ස්ථාවර තැන්පතු ආරම්භ කර ඇත. | වගකීම් පැනනැගීමේදී ඒවා සපුරාලීමට හැකි වන පරිදි අරමුදල් ආයෝජනය කළ යුතුය. |

**3.2** මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ ප්‍රගති වාර්තාව අනුව සයිබර් ආරක්ෂණය සහ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියේ අනුමත පිරිවැය රු. මිලියන 16.10 ක් වූ අතර අමාත්‍යාංශ ප්‍රගති වාර්තාව අනුව එය රු. මිලියන 15 ක් විය. තවද, අනුමත පිරිවැය ඉක්මවමින් | සමාගම පිළිතුරු ලබා දී නොතිබුණි. | ව්‍යාපෘති පිරිවැය අනුමත සීමාව තුළ පාලනය කළ යුතු වේ. |

**රු. මිලියන 17.6 ක් වැයකර තිබුණි.**